# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 අප්‍රේල් මස 20 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 අප්‍රේල් මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 12.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 7.50 යි.

## 2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 2009 අප්‍රේල් මස 20 වන දින]

එල්.ඩී.—ඕ. 46/2006.

**ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය සහ එහි කටයුතු කළමනාකරණය කිරීම සඳහා වගකිවයුතු එම ආයතනයේ සභාව පිහිටුවීම සඳහා ද, ආයතනයේ සාමාජිකයන් ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද, ආයතනයේ සාමාජිකයන්ගේ වෘත්තීය ප්‍රමිති හා විනය පවත්වාගෙන යාම සඳහා නිර්ණායක නිශ්චිතව දැක්වීම සඳහා ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය පනත යනුවෙන් සඳහන් කරනු ලැබේ. ලුහුඬු නාමය.

### I වන කොටස

### ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සංයුතිය, අරමුණු සහ බලතල

2. (1) (123 වන අධිකාරය වූ) සංගම් ආඥාපනත යටතේ සංස්ථාගත කරනු ලැබූ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ සංගමයේ තත්කාලයේ සාමාජිකයන් වන්නා වූ තැනැත්තන්ගෙන් සමන්විත වන (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය පිහිටුවීම.

(2) ආයතනය, (1) වන උපවගන්තිය මඟින් එයට ලබා දී ඇති නාමයෙන්, සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද එහි සංස්ථාපිත නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

3. ආයතනය සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු අරමුණු සඳහා ද එම අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතු බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ :— සංස්ථාවේ පොදු අරමුණු.

(අ) කළමනාකරණ ගණකාධිකාරීවරුන් සඳහා වෘත්තීය සංවිධානයක් ලබා දීම ;

(ආ) කළමනාකරණ ගණකාධිකරණ අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම, කළමනාකරණ ගණකාධිකරණ ප්‍රමිතීන් පිහිටුවීම සහ නිකුත් කිරීම, කළමනාකරණ ගණකාධිකරණයේ දී නිවැරදි ප්‍රතිපත්ති, ක්‍රමවේද සහ පරිචය අදාළ කර ගැනීම, දිරිමත් කිරීම ;

(ඇ) කර්මාන්ත, වාණිජ කටයුතු, අධ්‍යාපනය, මූල්‍ය, රාජ්‍ය සේවය සහ තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍රවල වෘත්තියෙහි යෙදීමේ දී කළමනාකරණ ගණකාධිකරණ වෘත්තිය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම ;

(ඈ) වෘත්තීය කළමනාකරණ ගණකාධිකාරී සුදුසුකම දක්වා වූ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී වැඩ සටහනක් පැවැත්වීම සහ එවැනි සුදුසුකමක වැදගත්කම අවධාරණය කිරීම සඳහා පියවර ගැනීම ;

(ඉ) ශාස්ත්‍රපති උපාධිය සහ ආචාර්ය උපාධි යන මට්ටම් දෙකේම සාමාජිකයන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා පශ්චාත් සුදුසුකම් ලැබීමේ කළමනාකරණ ගණකාධිකරණ සුදුසුකම් සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඊ) ආයතනයට සාමාජිකයන් ඇතුළත් කර ගැනීම නියාමනය කිරීම ;

(උ) කළමනාකරණ ගණකාධිකාරීන් ලෙස සුදුසුකම් ලැබීමට උනන්දුවක් දක්වන තැනැත්තන්ගේ වෘත්තීය අධ්‍යාපනය හා ප්‍රායෝගික පුහුණුව භාර ගැනීම සහ විධිමත් කිරීම සහ ශිෂ්‍යයා විසින් අධ්‍යයනය කළ යුතු ප්‍රායෝගික පුහුණු වැඩ සටහනක් අනුමත කිරීම ;

(ඌ) අධ්‍යාපනය, පුහුණුව සහ විභාග යන ආයතනයේ කර්තව්‍යය සැලකිල්ලට ගැනීමෙන් පසු, ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා නියම කිරීම සහ අනුමත කිරීම ;

(එ) නියමිත වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීම සඳහා විභාග පැවැත්වීම සහ පිළිගත් දේශීය හා විදේශීය වෘත්තීය හා අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා එම ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සහ ආයතනයේ සාමාජිකයන් සඳහා කළමනාකරණ ගණකාධිකාරී ක්ෂේත්‍රයේ නිදහස් කිරීම් සහ පිළිගැනීම් ලබා ගැනීම ;

(ඒ) විශ්වවිද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල කළමනාකරණ ගණකාධිකරණය අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම, සහයෝගයෙන් කටයුතු කිරීම සහ ඒවාට ආධාර කිරීම ;

(ඔ) ආයතනයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අදාළ වන සුදුසුකම් හා නුසුදුසුකම් නියම කිරීම සහ ආයතනයේ සාමාජිකයන්ට වෘත්තීය චර්යා ධර්ම හා ආචාර ධර්ම පිළිබඳ ප්‍රමිතීන් ඇති කිරීම ;

(ඕ) සාමාජිකයන්ගේ යහපත සඳහා අඛණ්ඩ වෘත්තීය අධ්‍යාපනයක් ලබාදීම සංවිධානය කිරීම, අධීක්ෂණය කිරීම සහ විධිමත් කිරීම ;

(ක) කළමනාකරණ ගණකාධිකාරී විෂයය පිළිබඳ උනන්දුවක් දක්වන සාමාජිකයන්ගේ, ශිෂ්‍යයන්ගේ සහ වෙනත් අයගේ ප්‍රයෝජනය සඳහා කළමනාකරණ ගණකාධිකාරී විෂයය හා අදාළ විෂයන් සම්බන්ධයෙන් වූ පොත්පත් සහ සඟරාවල මුද්‍රිත හා විද්‍යුත් යන මාධ්‍ය දෙකේ ම පුස්තකාලයක් පවත්වාගෙන යාම ;

(ග) කළමනාකරණ ගණකාධිකාරී විෂයය පිළිබඳ පොත්පත් සහ සඟරා පළ කිරීමට දිරිමත් කිරීම ;

(ච) කළමනාකරණ ගණකාධිකාරී විෂයෙහි නිපුනතා දක්වන තැනැත්තන් සඳහා ශිෂ්‍යත්ව, සම්මාන හා ත්‍යාග ප්‍රදානය කිරීම ; සහ

(ජ) ආයතනයේ සාමාජිකයන්ට හා ආයතනය විසින් නියම කරනු ලබන කොන්දේසි සපුරාලන අයට ඩිප්ලෝමා සහ සහතික ප්‍රදානය කිරීම.

ආයතනයේ සාමාජිකත්වය ලැබීම සඳහා සුදුසුකම්.

4. ආයතනයේ සාමාජිකත්වය ලැබීම සඳහා පහත දැක්වෙන තැනැත්තන් සුදුස්සන් වන්නේ ය :—

(අ) මේ පනත යටතේ ආයතනයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා සභාව විසින් පවත්වන සුදුසුකම් ලබන විභාගවලින් සමත් වන සහ සභාව විසින් කලින් කල නියම කරනු ලබන ප්‍රායෝගික පුහුණුව ලබා ඇති තැනැත්තකු ;

(ආ) කවර හෝ නමකින් හඳුන්වනු ලබන්නා වූ ද තත්කාලයේ දී සභාව විසින් සාදන ලද රීති මඟින් අනුමත කරනු ලැබුවා වූ ද සභාවේ මතය අනුව මෙම ආයතනයට සමාන තත්ත්වයක් ඇති සංගමයක් වූ ද ගණකාධිකාරීන්ගේ යම් වෘත්තීය මණ්ඩලයක සාමාජිකයකු වන තැනැත්තෙක්.

සාමාජිකයන් වර්ගීකරණය කිරීම.

**5.** (1) ආයතනයේ සාමාජිකයන්, අධි සාමාජිකයන්ගෙන් හා ආශ්‍රිත සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(2) යම් ශිෂ්‍යයකු ආයතනයේ සියලු විභාග සමත් වී, සභාව විසින් නියම කරනු ලබන අනුමත ක්ෂේත්‍රයක අවම වශයෙන් අවුරුදු තුනක ප්‍රායෝගික පළපුරුද්ද ලබා සභාව වෙත ඉල්ලීමක් කිරීමේ දී සහ නියමිත ගාස්තුව සභාවට ගෙවීමේ දී එම ශිෂ්‍යයා සභාව විසින් ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු ලෙස ලියාපදිංචිවීම සඳහා සුදුස්සකු වන්නේ ය. ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු ලෙස සභාව විසින් ලියාපදිංචි කිරීමේ දී එම සාමාජිකයාට, ඔහුගේ නමට පසු "A.C.M.A." යන කොටස භාවිතා කිරීමට අයිතිය ඇත.

(3) අවම වශයෙන් වසර තුනක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ හෝ සමාන පළපුරුද්දක් සහිතව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාලයක වසර පහකට අඩු නොවන කාලයක් සඳහා ගණකාධිකාරීවරයකුව, කළමනාකරණ උපදේශකයකුව හෝ කථිකාචාර්යවරයකුව සිටිනු ලැබූ බවට සභාව සෑහීමට පත්වන්නා වූ ආයතනයේ යම් සාමාජිකයකු විසින්, ආයතනය විසින් නියම කරනු ලබන අවශ්‍යතා සපුරාලීමෙන් පසු සභාව වෙත කරනු ලබන ඉල්ලීමක් මඟින් සහ නියමිත ගාස්තුව සභාව වෙත ගෙවීමෙන් පසු සභාව විසින් ආයතනයේ අධි සාමාජිකයකු ලෙස ලියාපදිංචිවීම සඳහා සුදුසුකම් ලබන්නේ ය. අධි සාමාජිකයකු ලෙස සභාව සාමාජිකයකු ලියාපදිංචි කිරීමෙන් පසු, තම නමට පසුව "F.C.M.A." යන නාමය එකතු කිරීමට එම සාමාජිකයාට හිමිකමක් තිබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ආයතනයේ අධි සාමාජිකයකු ලෙස ලියාපදිංචි නොවන සෑම සාමාජිකයකු ම, ආශ්‍රිත සාමාජිකයකු විය යුතු අතර, තමා ආශ්‍රිත සාමාජිකයකු බව පෙන්වීම සඳහා තම නමට පසුව "A.C.M.A." යන කොටස භාවිත කිරීමට එම තැනැත්තාට අයිතිවාසිකම් ඇත්තේ ය.

(5) ආයතනයේ සෑම සාමාජිකයකුට ම "සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරයා (CMA)" යන නිල නාමය ලබා ගැනීමට හෝ එය භාවිතා කිරීමට අයිතිය තිබිය යුතු ය.

(6) ආයතනයේ සාමාජිකයකු නොවන කිසිම තැනැත්තකු විසින් "සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරයා (CMA)" යන නිල නාමය හෝ ඉහත (3) සහ (4) වන උපවගන්තිවල සඳහන් එකතු කිරීම ලබා නොගත හෝ භාවිත නොකළ යුතු ය.

නිල නාම සහ ලාංඡනය භාවිත කිරීම.

**6.** (1) යම් තැනැත්තකු 5 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබන්නේ නම් මිස සහ ආයතනයේ සභාව විසින් ලිඛිතව අවසරයක් ලබා දී ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් විස්තරාත්මකව හෝ කෙටියෙන් යම් නිල නාමයක් ලබා ගැනීම හෝ භාවිත කිරීම නැතහොත් ආයතනයේ ලාංඡනය භාවිත කිරීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතු ය.

ආයතනයේ බලතල.

**7.** ආයතනයේ අරමුණු හා කාර්යය ඉටු කිරීමට සහ විශේෂයෙන් ම පහත සඳහන් දේ ඉටු කිරීමට සාධාරණ ලෙස අවශ්‍ය යම් බලතල, අයිතිවාසිකම් හා කර්තව්‍ය ආයතනයට තිබිය යුතු ය :—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළ කවර ආකාරයකින් හෝ අත්කරගෙන ඒවා දැරීම, බද්දට හෝ කුලියට ලබා ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ආ) කළමනාකරණ, පුහුණුවීම් හා අධ්‍යාපන මධ්‍යස්ථාන පිහිටුවීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම ;

(ඇ) කළමනාකරණය පිළිබඳ සියලු අංශ සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම, ඒවාට සහාය වීම, සම්බන්ධීකරණය කිරීම සහ දිරිමත් කිරීම ;

(ඈ) ස්වකීය නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කරවීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් පිළිබඳ විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ඉ) ආයතනය විසින් සලසනු ලබන යම් සේවා සඳහා ගාස්තු හෝ අයකිරීම් පැනවීම ;

(ඊ) ආයතනය වෙත සලසනු ලබන යම් සේවාවක් සඳහා ගාස්තු හෝ අයකිරීම් ගෙවීම ;

(උ) ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය උපකරණ ආනයනය කිරීම සහ ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපකරණ, අරමුදල් සහ වෙනත් ආධාර ලබා ගැනීම ;

(ඌ) ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පුද්ගලයන්ගේ සේවා ලබා ගැනීම ;

(එ) තම සේවකයන් සඳහා කාර්යය සාධන ප්‍රමිති සකස් කිරීම සහ එම කාර්ය සාධනය ඇගැයීම සහ ඒ පිළිබඳ සාධාරණ පියවර ගැනීම ;

(ඒ) තම සේවා නියුක්තයන් සඳහා සුභසාධන හා ක්‍රීඩා පහසුකම් ඇති කිරීම ;

(ඔ) පත් කිරීම, පුහුණුව, උසස් කිරීම, පාරිශ්‍රමික ගෙවීම, විනය පාලනය, හැසිරීම සහ නිවාඩු ලබාදීම ඇතුළු තම නිලධරයන් හා සේවකයන්ට අදාළ රීති සෑදීම ;

(ඕ) ආයතනයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම ;

(ක) ආයතනයේ සාමාජිකයන් සඳහා කළමනාකරණ ගණකාධිකරණය පිළිබඳ මාර්ගෝපදේශ හා ප්‍රමිති නිකුත් කිරීම ;

(ග) බැංකු ගිණුම් විවෘත කිරීම සහ ක්‍රියාත්මක කිරීම, මුදල් ණයට ගැනීම, ප්‍රදාන සහ පරිත්‍යාග ලබා ගැනීම, අරමුදල් ආයෝජනය කිරීම ;

(ච) ආයතනයේ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සුරැකිය යුතු ය ;

(ජ) ආයතනයේ කළමනාකාරීත්වය සහ එහි අරමුණු ඉටු කර ගැනීම සඳහා මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම, මෙම රීති සාදනු ලැබූ විට, මෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

**8.** (1) ආයතනයේ කළමනාකරණය, පාලනය සහ පරිපාලනය සඳහා වගකියනු ලැබිය යුතු (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවක් තිබිය යුතු ය. සභාවේ සංයුතිය.

(2) සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) ආයතනයේ සාමාජිකයන් අතුරින්, එම සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන සභාපතිවරයකු සහ උපසභාපතිවරයකු ;

(ආ) නිල බලයෙන් පත්වන පහත දැක්වෙන සාමාජිකයන් තිදෙනා :—

(i) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා හෝ ඔහුගේ නාමිකයකු ;

(ii) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපතිවරයා හෝ ආයතනයේ සභාවේ වර්තමාන සාමාජිකයකු වන, ඔහුගේ නාමිකයකු ;

(iii) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගිණුම් අධ්‍යයන අංශයේ ප්‍රධානියා හෝ ඔහුගේ නාමිකයකු ; සහ

(ඇ) ආයතනයේ සාමාජිකයන් අතුරින් එම සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් තිදෙනෙක්.

(3) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව වූ දිනයේ දී ධුර දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ සංගමයේ සභාවේ සාමාජිකයන්, මේ මඟින් පිහිටුවනු ලබන ආයතනයේ පළමුවන සභාවේ සාමාජිකයන් විය යුතු අතර, අවුරුදු හතරක කාලයක් ධුර දැරිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ (අ) සහ (ඇ) ඡේද ප්‍රකාරව සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සඳහා වූ ඡන්ද විමසීම සභාවේ රීතිවලට අනුකූලව පැවැත්විය යුතු ය.

**9.** (1) සභාවේ සෑම සාමාජිකයෙක්ම කලින් ධුරය අත්හලහොත් මිස, අවස්ථාවෝචිත පරිදි තමා පත් කිරීමේ දින සිට හෝ තෝරා පත් කර ගැනීමේ දින සිට අවුරුදු දෙකක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය : සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය.

එසේම, තවදුරටත්, 8 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් දිනයේ සිට අවුරුදු හතරක කාලයක් අවසාන වීමෙන් ධුර දරන එම උපවගන්තිය යටතේ පත් කරන ලද සාමාජිකයන් ඉන්පසු ධුර අත්හැරිය යුතු නමුත් නැවත තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සෝ වෙති.

(2) සභාවේ සාමාජිකයකු ඉල්ලා අස්වීම මගින් හෝ ආයතනයේ සාමාජිකයකු වීම අවසන් වුවහොත් තම ධුරය අත්හල යුතු ය.

(3) සාමාජිකයකු මියයාමේ දී හෝ සභාවේ සාමාජිකයකු විසින් ධුරය අත්හැරීමේ දී එම සාමාජිකයා වෙනුවට අවස්ථාවෝචිත පරිදි 7 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව වෙනත් තැනැත්තකු පත් කිරීම හෝ තෝරා පත් කර ගැනීම සිදු කළ යුතු අතර, එම සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුර දැරිය යුතු ය.

(4) කාලය ඉකුත් වීම නිසා තම ධුරය අත්හරින සභාවේ යම් සාමාජිකයකු නැවත පත් කිරීම සඳහා හෝ නැවත තෝරා පත් කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(5) සභාව විසින් සමාව දෙනු ලැබුවහොත් මිස හෝ යම් සාමාජිකයකු සභාවේ සාමාජිකයකු වීම අවසන් වුවහොත් මිස, යම් සාමාජිකයකු සභාවේ රැස්වීම් තුනකට එක දිගට පැමිණීමට අපොහොසත් වුවහොත්, එම සාමාජිකයා ධුරය අත්හැර ගියාසේ සලකනු ලැබිය යුතු ය.

සාමාජිකයකු පත්කිරීමේ ලා යම් දෝෂයක් තිබීමේ හෝ සාමාජිකයකුගේ පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසා ආයතනයේ ක්‍රියා හෝ කටයුතු අවලංගු ලෙස සලකනු නොලැබිය යුතු බව.

**10.** සභාවේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ සභාවේ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් ආයතනයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු ලෙස සලකනු නොලැබිය යුතු ය.

උපදේශක මණ්ඩලයක් පත් කිරීම.

**11.** අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා විශිෂ්ට පුද්ගලයන් දහ දෙනකුට වැඩි නොවන සංඛ්‍යාවකගෙන් සමන්විත වන උපදේශක මණ්ඩලයක් සභාව විසින් පත් කිරීම නීත්‍යානුකූල වන්නේ ය. සභාව විසින් සිය අභිමතය පරිදි උපදේශක මණ්ඩලයේ අදහස් හා උපදෙස් පැතිය හැකි නමුත්, එවැනි උපදේශයක් භාර ගැනීමට හෝ ක්‍රියාවේ යෙදවීමට කිසිඳු ආකාරයකින් සභාව බැඳී නැත. උපදේශක සභාවට ඡන්දය දීමේ අයිතියක් නොමැත.

12. ආයතනයේ අනුශාසකවරුන් ලෙස සේවය කිරීම සඳහා සභාව විසින් කලින් කල වෘත්තීය පසුබිමක් ඇති විශිෂ්ට දේශීය හෝ විදේශීය තැනැත්තන්ට ආරාධනය කළ හැකි ය. යම් ඇතුළුවීමේ ගාස්තුවක් හෝ වාර්ෂික දායක මුදලක් ගෙවීමට ඔවුන්ට නියම කරනු නොලැබිය යුතු ය. ආයතනයේ අනුශාසකවරුන්.

13. සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයක් ආයතනයේ අරමුදල්වලින් සභාවේ සියලුම හෝ යම් සාමාජිකයකුට ගෙවනු ලැබිය හැකි ය. සාමාජිකයන්ගේ පාරිශ්‍රමිකය.

14. (1) සභාවේ රැස්වීම් අවම වශයෙන් මසකට එක් වරක්වත් පවත්වනු ලැබිය යුතු ය. සභාවේ රැස්වීම්.

(2) සභාවේ සෑම රැස්වීමක් පිළිබඳව, එක් එක් සාමාජිකයාට අවම වශයෙන් දින හතක දැන්වීමක් ලිඛිතව කළ යුතු අතර, එම රැස්වීමේ දී සිදු කරනු ලබන කටයුතු එම දැන්වීමේ නිශ්චිතව දැක්විය යුතු ය.

(3) සභාවේ සාමාජිකයන් පස් දෙනකු විසින් තත් කාර්යය සඳහා ලිඛිතව ඉල්ලීමක් කර දින හතක් ඇතුළත සභාපතිවරයා විසින් සභාවේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

(4) සභාවේ සාමාන්‍ය රැස්වීමක් සඳහා වූ ගණපූරණය පැමිණ සිටින හෝ පෙරකලාසි මගින් පෙනී සිටින සාමාජිකයන් තුන් දෙනකු විය යුතු ය.

(5) සභාවේ රැස්වීමකට පැමිණෙන සෑම සාමාජිකයකුටම, සභාව විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයකින් සමන්විත වන ගාස්තුවක් හෝ එවැනි රැස්වීමකට පැමිණීමේ දී දැරීමට සිදු වූ යම් වියදමක් හානිපූරණය කිරීම සඳහා මුදලක් ගෙවනු ලැබිය යුතු ය.

(6) සභාවේ රැස්වීම්වල දී සභාපතිවරයා මුලසුන දැරිය යුතු අතර, සභාපතිවරයා පැමිණ නොසිටින විට එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් බහුතරයක් විසින් තෝරා පත් කරගනු ලබන සාමාජිකයෙක් එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(7) අසනීපවීම නිසා හෝ ශාරීරික දුබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා සභාපතිවරයාට තාවකාලිකව තම ධුරයේ කටයුතු ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක සභාව විසින් ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා එක් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

(8) සභාවේ රැස්වීමක දී තීරණය කරනු ලබන යම් කරුණක් හෝ දෙයක් පිළිබඳව ඡන්ද සමාන වන අවස්ථාවක දී එම රැස්වීමේ සභාපතිවරයාට තම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(9) මෙහි අන්තර්ගත විධිවිධානවලට යටත් ව, සභාවේ කටයුතු සිදු කිරීමේ කාර්ය පටිපාටිය සභාව විසින් ම තීරණය කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

### ආයතනයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම

ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා පත් කිරීම.

**15.** (1) ආයතනයේ කාර්ය මණ්ඩලයට සභාව විසින් ප්‍රධාන විධායක නිලධරයෙක් පත් කරනු ලැබිය හැකි අතර, ඔහු විසින් ආයතනයේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) ප්‍රධාන විධායක නිලධරයා විසින් තමා වෙත පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීම ද, කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම ද සිදු කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද ප්‍රධාන විධායක නිලධරයා සභාව විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) සභාව විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයන් ප්‍රධාන විධායක නිලධරයාට ගෙවනු ලැබිය හැකි ය.

ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම් සිදු කිරීම සම්බන්ධයෙන් ආයතනයේ බලතල .

**16.** (1) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව සභාව විසින්—

(අ) ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය;

(ආ) ආයතනයේ කාර්ය මණ්ඩලය සේවයෙන් පහ කිරීම හෝ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය සිදු කළ හැකි ය ;

(ඇ) කාර්ය මණ්ඩලයේ පඩි හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කරනු ලැබිය හැකි ය;

(ඈ) කාර්ය මණ්ඩලයේ සේවය පිළිබඳව නියම හා කොන්දේසි තීරණය කළ හැකි ය;

(ඉ) එම කාර්ය මණ්ඩලයේ සුභසාධනය සඳහා සේවක අර්ථසාධක අරමුදල් සහ යෝජනා ක්‍රම පිහිටුවා පාලනය කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන කාරණාවක් හෝ සියලු කාරණා සම්බන්ධයෙන් මේ පනත යටතේ රීති සාදනු ලැබිය හැකි ය.

පත් කිරීම් සම්බන්ධයෙන් ප්‍රධාන විධායක නිලධරයාට සභාවේ බලතල පැවරීම.

**17.** (1) ආයතනයේ කාර්ය මණ්ඩලයට නිලධරයන් හෝ සේවකයන් පත් කිරීමට අදාළව සභාවේ බලතලවලින් යම් බලතල සභාව විසින් ප්‍රධාන විධායක නිලධරයා විසින් පවරනු ලැබිය හැකි ය. තමා වෙත පවරන ලද බලතල යටතේ ප්‍රධාන විධායක නිලධරයා විසින් පත් කරනු ලබන වෘත්තීය කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික ඇතුළු සේවා කොන්දේසි සභාවේ අනුමතිය ඇතිව තීරණය කරනු ලැබිය යුතු ය.

(2) ප්‍රධාන විධායක නිලධරයා විසින් හෝ ආයතනයේ වෘත්තීය කාර්ය මණ්ඩලයේ නිලධරයෙක් හෝ සේවකයෙක් හෝ යම් සාමාජිකයෙක් විසින් කරනු ලබන කාර්ය මණ්ඩලයේ සේවයෙන් නෙරපීම සභාව විසින් අනුමත කරනු ලබන්නේ නම් මිස බලාත්මක නොවිය යුතු ය.

කාර්යය තීරණය කිරීම.

**18.** සභාවේ එකඟත්වය ඇතිව ප්‍රධාන විධායක නිලධරයා විසින් ආයතනයේ නිලධරයන් හා සේවකයන්ගේ කාර්යය තීරණය කළ යුතු ය.

රීති.

**19.** (1) සභාව විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය :—

(අ) එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු වර්ගීකරණය, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඉවත් කර ගැනීම, සාමාජික ගාස්තු නොගෙවීම මත නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) ආයතනයේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම, ඔවුන්ගේ බලතල, කාර්යය, කර්තව්‍ය සහ හැසිරීම, පාරිශ්‍රමික ගෙවීම, අර්ථසාධක අරමුදල් සහ ඔවුන්ගේ ප්‍රතිලාභ සඳහා වූ වෙනත් යෝජනා ක්‍රම විධිමත් කිරීම ;

(ඇ) ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු, වාර්ෂික දායක මුදල්, විභාග ගාස්තු, දේශන ගාස්තු, අධ්‍යයන ග්‍රන්ථ සහ වෙනත් ප්‍රකාශනවල මිළ නියම කිරීම ;

(ඈ) විශේෂිත විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සභාවේ සාමාජිකයන්ගෙන් සහ ආයතනයේ සාමාජිකයන්ගෙන් සමන්විත වන්නා වූ සභාවේ කමිටු සහ අනුකමිටු පත් කිරීම සහ කමිටුවල කටයුතු විධිමත් කිරීම සඳහා ;

(ඉ) සභාවේ ධුරයට තෝරා පත් කර ගැනීම හෝ ධුරය අත්හැරීම හෝ ඉන් ඉවත් කරනු ලැබීම සහ ඔවුන් ධුරවලින් ඉල්ලා අස්වීම සහ ඔවුන්ගේ බලතල සහ සභාවේ කාර්යය සහ හැසිරීම ;

(ඊ) සභාවේ සහ ආයතනයේ රැස්වීම්, වාර්ෂික මහා සභා රැස්වීම් සහ අතිවිශේෂ රැස්වීම කැඳවීම් හා පැවැත්වීම, පුරප්පාඩු පිරවීම, එම රැස්වීම්වල දැන්වීම් සහ න්‍යාය පත්‍රය, ඒ සඳහා ගණපූරණය සහ එහි දී සිදු කරනු ලබන කාර්යයන් ;

(උ) සභාවේ සහ ආයතනයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම් ;

(ඍ) ආයතනයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ;

(එ) විනය කමිටු පිහිටුවීම සහ ආචාර ධර්ම පද්ධතියක් සැකසීම, සාමාජිකයන් විෂයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම, විනය පටිපාටිය සහ සාමාජිකයන් නෙරපීම හෝ සාමාජිකත්වය අත්හිටුවීම ; සහ

(ඒ) සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමට අදාළ ඇතුළත් කර ගැනීමේ උපමාන.

(2) 19 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ සිට (ඒ) ඡේදය දක්වා වන ඡේද යටතේ සභාව විසින් සාදනු ලබන සෑම රීතියක්ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

## මුදල්

**20.** (1) ආයතනයට එහිම අරමුදලක් තිබිය යුතු ය. ආයතනයේ අරමුදල.

(2) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී ආයතනයට ලැබුණු සියලු මුදල් ආයතනයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) අරමුදලේ මුදල් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් නිකුත් කරනු ලබන හෝ ඇප වන යම් සුරැකුම්පත්වල ආයෝජනය කරනු ලැබිය හැකි ය.

(4) සභාව විසින් ශ්‍රී ලංකාවේ අනුමත යම් බැංකුවක හෝ බැංකුවල, ඇමතුම්, ජංගම, ඉතිරි කිරීමේ හෝ තැන්පතු ගිණුම් පවත්වාගෙන යා හැකි ය.

(5) ආයතනය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී කාර්යය සහ කර්තව්‍ය ඉටුකිරීමේ දී දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් අරමුදලින් අයකර ගනු ලැබිය යුතු ය.

ආයතනයේ මුදල් වර්ෂය.

**21.** ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ගිණුම් විගණනය කිරීම.

**22.** (1) ආයතනයේ ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් තැබීමට ආයතනය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) ආයතනයේ ගිණුම් ආයතනය විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මෙම වගන්තියෙහි "සුදුසුකම් ලත් විගණකවරයකු" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මඟින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද ගණකාධිකාරීවරයකු ලෙස සේවයේ යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක සන්තකය දරන්නා වූ ද තැනැත්තකු ; හෝ

(ආ) එක් එක් නේවාසික කොටස්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මඟින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු ලෙස සේවයේ යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක සන්තකය දරන්නා වූ ද ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

ගිවිසුම.

**23.** (1) ආයතනය සම්බන්ධයෙන් යම් ගිවිසුම් පහත දැක්වෙන පරිදි සාදනු ලැබිය හැකි ය :—

(අ) පෞද්ගලික තැනැත්තන් අතර ලිඛිතව සකස් කළ යුතු බවට නීතිය මඟින් නියම කර ඇත්නම් එම ගිවිසුම් ආයතනයේ පොදු මුද්‍රාව යටතේ ආයතනය වෙනුවෙන් ලිඛිතව සකස් කළ යුතු ය ;

(ආ) පෞද්ගලික තැනැත්තන් අතර සාදනු ලබන්නේ නම් ලිඛිතව සකස් කළ යුතු බවට, නීතිය මඟින් නියම කර ඇත්නම් එය භාරව සිටින පාර්ශ්වයන් විසින් අත්සන්

කළ යුතු බවටත්, ආයතනය විසින් ඊට බලය පවරන ලද යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ලිඛිතව සකස් කොට ආයතනය වෙනුවෙන් අත්සන් කරනු ලැබිය හැකි ය;

(ඇ) පෞද්ගලික තැනැත්තන් අතර සාදනු ලබන්නේ නම්, ලිඛිතව සකස් නොකොට වාචිකව සකස් කරගනු ලැබුවද වලංගු වන බවට නීතිය මඟින් නියම කර ඇත්නම්, ආයතනය විසින් යථා පරිදි බලය පවරන ලද යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ආයතනය වෙනුවෙන් වාචිකව සකස් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියට අනුව, සාදන ලද ගිවිසුමක් නීතියෙහි ලා බලාත්මක වන අතර, ආයතනය සහ ඊට අදාළ සියලු තැනැත්තන් සහ ඔවුන්ගේ නෛතික නියෝජිතයන් ඉන් බැඳී සිටී.

ආයතනය විසින් දරන ලද වියදම් ආපසු අයකර ගැනීම.

**24.** යම් අධිකරණයක් ඉදිරිපිට, ආයතනය විසින් හෝ එයට එරෙහිව, පවරනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ආයතනය විසින් දරන ලද යම් වියදමක් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ආයතනය විසින් අයකර ගනු ලබන සෑම නඩු ගාස්තුවක්ම, ආයතනයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ ආයතනයේ විධානය මත කරනු ලබන ක්‍රියා සඳහා ආරක්ෂාව.

**25.** (1) (අ) මේ පනත යටතේ ආයතනය විසින් සද්භාවයෙන් සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි අදහස් කරනු ලබන යම් නීත්‍යානුකූල ක්‍රියාවක් සඳහා ආයතනයට එරෙහිව ; හෝ

(ආ) අවස්ථාවෝචිත පරිදි, මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සඳහා එම සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ අනුයෝජිතයාට එරෙහිව,

කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත (1) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන යම් තැනැත්තකු විසින් සිදු කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට ඔහුට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එම තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, එම ක්‍රියාව සද්භාවයෙන් සිදු කළ බවට අධිකරණය තීරණය කරන්නේ නම් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සභාවේ සාමාජිකයකුට හෝ ඒ සාමාජිකයාගේ දේපළට එරෙහිව කිසිදු රීට් බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

**26.** ආයතනයට එරෙහිව පවරන ලද යම් නඩුවක දී සභාවේ සාමාජිකයකුට එරෙහිව හෝ ඔහුගේ දේපළට එරෙහිව කිසිදු රීට් බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

වැරදි සහ දණ්ඩන.

**27.** මේ පනත යටතේ යම් වරදක් සිදු කරන සෑම තැනැත්තෙක්ම, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට නඩු විභාගයකින් පසු වරදකරු වීමේ දී මාස හයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්සියයකට වැඩි නොවන දඩයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**28.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.